# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ඉහළ දිස්ත්‍රික්කයේ නාවලපිටිය අංගණය සඳහා

### EN 45 E1 රේල් පීලිවලට ගැළපෙන උසින් අඩු කොන්ක්‍රීට් සිල්පර (Less High Concrete Sleepers) 5000ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය - ලංසු ආරාධනා අංක - SRS F. 7974**

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, දේශීය නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන් වෙතින්, ඉහළ දිස්ත්‍රික්කයේ නාවලපිටිය අංගණය සඳහා **EN 45 E1**රේල් පීලිවලට ගැළපෙන, උසින් අඩු කොන්ක්‍රීට් සිල්පර 5000ක් සැපයීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබා ගැනීමත් ලංසුලේඛන පරීක්ෂාකොට බැලීමත් පහත සඳහන් ලිපිනයේ දී රාජකාරී දිනවල 2024.03.28 දින සිට 2024.04.17 දක්වා පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර, කාලය තුළ සිදුකළ හැක.

    නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),
    දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
    ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව
    දුරකථන අංක : **94(11)2438078 හෝ 94(11) 2436818**
    ෆැක්ස් අංක : **94 (11) 2432044**
    ඊ මේල් : **srs.slr@gmail.com**
    වෙබ් අඩවිය : **www.railway.gov.lk**

04. පසුගිය වසර පහ (05) තුළ, ලංසුකරු විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත කොන්ක්‍රීට් සිල්පර 5000කට වඩා සපයා තිබිය යුතු අතර, නැතහොත්, වටිනාකම රුපියල් මිලියන 50කට හෝ ඊට වැඩි පෙර වැර කොන්ක්‍රීට් බාල්ක හෝ වටිනාකම රුපියල් මිලියන 500කට වැඩි පෙර වැර කොන්ක්‍රීට් කණු සපයා තිබිය යුතු අතර, ඒවා සඳහා ලද, ඉන්වොයිස්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

05. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 31,250/- ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2024.03.28 දින සිට 2024.04.17 දින ප.ව. 3.00 දක්වා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

06. සියදුම ලංසු සමග වටිනාකම රුපියල් 1,750,000.00 වූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් ලෙසට වූ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

07. ලංසු පහත සඳහන් ලිපිනය වෙත, 2024.04.18 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු අතර, ඒ හා සමගම ලැබී ඇති ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F. 7974**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

# ප්‍රසම්පාදන දැන්වීම

---

දේශගුණී

ව

**IFB No : CR**

1. ප්‍රතිසංස්කරණ සහ
   වැඩසටහන් ප්‍රවේශය
   ගෙවීම් ආවරණය කි
   පැහැදිලි කර ඇති පරි

2. මොණරාගල, වාරිමා
   මුද්‍රා තැබූ ලංසු කැඳව

| කොන්ත්‍රාත් පැකේජ අංකය |
|---|
| CResMPA-1/ RP/WORKS/ID-MON/NCB/029 |
| CResMPA-1/ RP/WORKS/ID-MON/NCB/032 |
| CResMPA-1/ RP/WORKS/ID-MON/NCB/042 |
| CResMPA-1/ RP/WORKS/ID-MON/NCB/060 |
| CResMPA-1/ RP/WORKS/ID-MON/NCB/061 |
| CResMPA-1/ RP/WORKS/ID-MON/NCB/062 |
| CResMPA-1/ |